# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2264/61 - 2022 ජනවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

**34 වන වගන්තිය යටතේ වූ නියමය**

2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 34 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තාක්ෂණ අමාත්‍ය ගෝඨාභය රාජපක්ෂ වන මා විසින් අවශ්‍ය යටිතල පහසුකම්, වැඩපිළිවෙල සහ තාක්ෂණික ක්‍රමවේද සකස් කරන තුරු 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 6, 9, 14, 16 හා 17 වන වගන්ති සහ එම පනත යටතේ සාදන ලද සෑම නියෝගයක් ම (1990 නොවැම්බර් 20 වැනි දින අංක 637/6 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1990 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග හැර) ක්‍රියාත්මක වීමේ කාල සීමාව අවසන් වන දිනය වශයෙන් 2016 අගෝස්තු මස 11 වැනි දින අංක 1979/40 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනය 2022.12.31 දින වශයෙන් මෙම නියමය මඟින් වෙනස් කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති සහ තාක්ෂණ අමාත්‍ය.

2022 ජනවාරි මස 24 වැනි දින.

EOG 01 - 0309


1A - G 35940 – 15 (2022/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*